# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2038/37 – 2017 සැප්තැම්බර් 28 වැනි බ්‍රහස්පතින්දා – 2017.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙය, අංක 62/25, කටුකුරුන්දවත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්ත, අංක 114/1හි, පී. දනන්සූරිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙය, අංක 62/25, කටුකුරුන්දවත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"ඉහත නම් සඳහන් සේවකයින් පස්දෙනා හට විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම මගින් එකී සේවකයන්ට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ,"

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන).

2017 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 369

---

මගේ අංකය: IR/COM/04/2016/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. ඩබ්ලිව්. රංජන් සිසිර මයා, අංක. 1144/5/ඒ, ලියනගොඩ පාර, කොට්ටාව, පන්නිපිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම, අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත

වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

කේ. ඩබ්ලිව්. රංජන් සිසිර මයා, අංක. 1144/5/ඒ, ලියනගොඩ පාර, කොට්ටාව, පන්නිපිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම, අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

‘‘සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ විශේෂ (M2) ශ්‍රේණියේ ගබඩා නිලධාරියකු ලෙස සේවය කළ කේ. ඩබ්ලිව්. රංජන් සිසිර මහතාට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වා ඔහුට A5 ශ්‍රේණියේ ගබඩා සහකාර තනතුරට තත්ත්වයෙන් පහත හෙළීම හා අදාළ විනය නියෝගයෙන් ඔහුට ලබා දුන් අනෙකුත් දඬුවම් යුක්ති සහගත ද? එසේ නැත්නම් එම සේවකයාට හිමිවිය යුතු වෙනත් සහනයක් ඇත් ද?’’

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන).

2017 ජුනි මස 22 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 370

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.